# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2186/13 - 2020 ජූලි මස 28 වැනි අඟහරුවාදා - 2020.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : එම්ජී/ඒසීකිව්/එල්819.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/8/2014/PC/373.

කොළඹ මහා නගර සභාවට අයත් කිරුළපන කාවින්ද පෙදෙස පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට පවරා ගැනීමට ඇති බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*අත්කර ගැනීමට නියමිත ඉඩම් පිළිබඳ විස්තරය:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළඹ මහා නගර සභා සීමාව තුළ නැගෙනහිර පාමංකඩ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2020.02.28 වැනි දින සහතික කරන ලද අංක කො. 9820 දරන මූලික පිඹුරේ අංක 1 සහ 2 වශයෙන් පිළියෙල කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0379 වන පහත විස්තර කර ඇති ඉඩම් කැබලි 02.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: හයිලෙවල් පාර වරිපනම් අංක 200 (කොටසක්); විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: සී. ජී. ද අල්විස් සෙනෙවිරත්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0202.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: වරිපනම් අංක 5 (කොටසක්) කාවින්ද පෙදෙස; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: යූ. එම්. සිල්වා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0177.

ඉහත සඳහන් ඉඩම් ගැන උනන්දුවක් දක්වන සියලු දෙනා පෞද්ගලිකව හෝ නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයින් මගින් 2020 අගෝස්තු මස 27 වැනි දින පෙ.ව. 10.00 ට කොළඹ මහ නගර සභා කොමසාරිස් කාර්යාලයේ දී මා ඉදිරියේ පෙනී සිටිය යුතු බවත්, එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව දැක්වීමේ ස්වභාවය ද, එකී ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා සිටීමේ විස්තර ද, වන්දි ප්‍රමාණය ගැන විස්තර ද 2020 අගෝස්තු මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ඉදිරිපත් කළ යුතුය.

ඔවුන්ගේ හිමිකම් සම්බන්ධයෙන් සියලු ඔප්පු හා අනිකුත් ලියවිලි ද පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

නීතිඥ රෝෂණී දිසානායක,
නාගරික කොමසාරිස්, කොළඹ මහ නගර
සභාව සහ කොළඹ මහ නගර සභා බල
සීමාව තුළ ඉඩම් අත්කරගැනීමේ නිලධාරී.

2020 ජූලි 22 වැනි දින,
කොළඹ 07, නගර ශාලාවේ,
නාගරික කොමසාරිස් කාර්යාලයේ දී ය.

08-192